## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# ඇබෑර්තු

**පරිපාලන කාර්ය මණ්ඩලය - ස්ථිර පදනම**

**රත්මලාන පරිශ්‍රය සහ දක්ෂිණ මණ්ඩපය - සූරියවැව**

- සහකාර ලේඛකාධිකාරී තනතුර

**දක්ෂිණ මණ්ඩපය - සූරියවැව**

- සහකාර මූල්‍යාධිකාරී තනතුර

**ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි - කොන්ත්‍රාත් පදනම**

**රත්මලාන පරිශ්‍රය**

- කළමනාකරණ සහකාර III ශ්‍රේණිය තනතුර (එක් අවුරුදු කොන්ත්‍රාත් පදනම)

## සුදුසුකම් සහ බඳවා ගැනීමේ පරිපාටිය

**පරිපාලන කාර්ය මණ්ඩලය - ස්ථිර පදනම**

- සහකාර ලේඛකාධිකාරී තනතුර

බාහිර අයදුම්කරුවන් සඳහා

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත්, පළමු හෝ දෙවන පෙළ සාමාර්ථය සහිත උපාධියක්

හෝ

(ආ) උපාධිය සමඟ පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් පරිපාලන/කළමනාකරණය** පිළිබඳ පශ්චාත් උපාධියක්/පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් තිබිය යුතුය.

වයස: අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් මූලික උපාධිය සහිත කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙහි සේවය කරනු ලබන දැනට දරන තනතුරෙහි ස්ථිර කරනු ලැබූ සේවකයෙකු විය යුතුය.

හෝ

(ආ) කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙහි සේවය කරනු ලබන U–MN–1(II) / U–MT–1(II) කාණ්ඩයට යටත්වන තනතුරක් දරන්නෙකු විය යුතු අතර එම තනතුරේ ස්ථිර කරනු ලැබූ සේවකයෙකු විය යුතුය.

වයස: අවුරුදු 53 ට නොවැඩි විය යුතුය.

**

- රාජ්‍ය/ව්‍යාපාර පරිපාලනය
- කළමනාකරණය
- රාජ්‍ය ප්‍රතිපත්ති
- මානව සම්පත් කළමනාකරණය
- ආර්ථික විද්‍යාව
- නීතිය
- මූල්‍ය කළමනාකරණය

- ව්‍යාපෘති සැලසුම් හා කළමනාකරණය
- තොරතුරු තාක්ෂණය
- කළමනාකරණ/පරිපාලන විෂයයන් සැලකිය යුතු ප්‍රමාණයක් ආවරණය වන ඕනෑම විෂය ධාරාවක්

- සහකාර මූල්‍යාධිකාරී තනතුර

<u>බාහිර අයදුම්කරුවන් සඳහා</u>

1. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ ඊට සමාන ආයතනයක II වන (අවසාන) විභාගය සමත් විය යුතුය.

හෝ

2. (අ) (i) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් ගිණුම්කරණය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබිය යුතුය.

හෝ

(ii) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් උපාධියක් සමඟ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ ඊට සමාන ආයතනයක මධ්‍යම මට්ටම විභාගය සමත් විය යුතුය.

හෝ

(iii) ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයෙන් (SLIATE) හෝ එහි පුරෝගාමී ආයතනයකින් ලබාගත් ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA) ලබා තිබිය යුතුය.

සහ

(ආ) රාජ්‍ය ආයතනයක/රජයේ සංස්ථාවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක ගිණුම්කරණය/විගණන කාර්යය සම්බන්ධ වසර දෙකක (02) පළපුරුද්ද ලබා තිබිය යුතුය.

වයසඃ අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

<u>අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා</u>

1. (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් ගිණුම්කරණය පිළිබඳ මූලික උපාධිය සහිත කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙහි සේවය කරනු ලබන දැනට දරන තනතුරෙහි ස්ථිර කරනු ලැබූ සේවකයෙකු විය යුතුය.

හෝ

(ආ) කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙහි සේවය කරනු ලබන U–MN–1(II) / U–MT– 1(II) කාණ්ඩයට යටත්වන තනතුරක් දරන්නෙකු විය යුතු අතර එම තනතුරේ ස්ථිර කරනු ලැබූ සේවකයෙකු විය යුතුය.

සහ

2. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයෙහි ගිණුම් අංශයෙහි/ විගණන අංශයෙහි අවම වසර දෙකක (02) පළපුරුද්ද ලබා තිබිය යුතුය.

වයස : අවුරුදු 53 ට නොවැඩි විය යුතුය.

**සුදුසුකම් සීමා කිරීම් :**

(අ) බඳවා ගැනීමේ පරිපාටියට අනුව පවත්වනු ලබන ලිඛිත විභාගයට බාහිර කාණ්ඩය යටතේ හෝ අභ්‍යන්තර කාණ්ඩය යටතේ වාර දෙකකට (02) වඩා පෙනී සිටීමට කිසිදු අපේක්ෂකයෙකුට අවසර දෙනු නොලැබේ.

(ආ) කිසියම් අභ්‍යන්තර අපේක්ෂකයෙකු අභ්‍යන්තර සහ බාහිර යන කාණ්ඩ දෙක යටතේම සුදුසුකම් ලබන්නේ නම්, ඔහු/ඇය අභ්‍යන්තර කාණ්ඩය යටතේ වාර දෙකක් (02) සහ බාහිර කාණ්ඩය යටතේ වාර දෙකක් (02) ලෙස ලිඛිත විභාගයට පෙනී සිටීමට වාර හතරක් (04) අවසර දෙනු ලැබේ.

(ඇ) කිසියම් හෝ ආගමක පැවිදිවරය/පූජාවරය ලබා සිටින අයවලුන් හට බඳවා ගැනීමේ ලිඛිත විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

**බඳවා ගැනීමේ පරිපාටිය :**

එක් එක් කාණ්ඩය යටතේ සියලුම අයදුම්කරුවන් පහත පරිදි අදාළ කාණ්ඩයට අදාළ විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ලිඛිත විභාගයකින් සමත් විය යුතුය.

- සහකාර ලේඛකාධිකාරී තනතුර

<u>බාහිර කාණ්ඩය</u>

1) බුද්ධි පරීක්ෂණය සහ තර්කනය
2) කළමනාකරණ නිපුණතාව
3) ඉංග්‍රීසි භාෂාව

<u>අභ්‍යන්තර කාණ්ඩය</u>

1) විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ නීති සහ රෙගුලාසි
2) සාමාන්‍ය පරිපාලනය සහ මූල්‍ය ක්‍රියාපටිපාටි
3) ඉංග්‍රීසි භාෂාව

- සහකාර මූල්‍යාධිකාරී තනතුර

<u>බාහිර කාණ්ඩය</u>

1) බුද්ධි පරීක්ෂණය සහ තර්කනය
2) ගිණුම්කරණය සහ මූල්‍ය
3) ඉංග්‍රීසි භාෂාව

<u>අභ්‍යන්තර කාණ්ඩය</u>

1) විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ නීති සහ රෙගුලාසි
2) ගිණුම්කරණ සහ මූල්‍ය පරිපාලන ක්‍රියා පටිපාටි
3) ඉංග්‍රීසි භාෂාව

* ලිඛිත පරීක්ෂණය ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වනු ලැබේ.

**ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි**

- කළමනාකරණ සහකාර III ශ්‍රේණිය තනතුර (එක් අවුරුදු කොන්ත්‍රාත් පදනම)

1. i. සිංහල භාෂාව/ දෙමළ භාෂාව
   ii. ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍ය
   iii. ගණිතය

   යන විෂයයන්ගෙන් විෂයන් 03 ටම සම්මාන සමාර්ථ සහිතව එක් වරකදී අ.පො.ස (සා.පෙළ) විභාගයෙන් විෂයන් 06 කින් සමත් වී තිබීම.

සහ

2. එක් වරකදී අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් සියලුම විෂයන් (පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම. (මේ සඳහා පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 3ක් එකවර සමත්වීම ප්‍රමාණවත් වේ.)

3. පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

   (අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොවැඩි කාල සීමාවක පරිගණක යෙදවුම් පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් ලබා තිබීම.

සහ

   (ආ) පරිගණක යෙදවුම් මෘදුකාංග පිළිබඳ වසර 02 පළපුරුද්ද.

**සටහන :-  සුදුසුකම්**

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ආ)අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.
(ඇ)යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

**බඳවා ගැනීමේ පරිපාටිය:**

පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ලිඛිත පරීක්ෂණයක් :

- සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම
- බුද්ධි පරීක්ෂණය සහ සාමාන්‍ය දැනුම
- පරිගණක සාක්ෂරතාව

* ලිඛිත පරීක්ෂණය ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වනු ලැබේ.

**වැටුප් පරිමාණ**

1. සහකාර ලේඛකාධිකාරී සහ සහකාර මුල්‍යාධිකාරී තනතුරු:-
U-EX I (II) Rs. 50,625 – 3x1,125 – 54,000 (EB) 55,335; 12x1,335 - 71,355 p.m. + (45% අනධ්‍යයන දීමනාව + වෙනත් අනුමත දීමනා)

2. කළමනාකරණ සහකාර III ශ්‍රේණිය තනතුර (එක් අවුරුදු කොන්ත්‍රාත් පදනම) :-
Rs. 30,725 p.m. + (රු. 7,800 ජීවන වියදම් දීමනාව + රු. 5,000 මාසික දීමනාව)

**බඳවා ගැනීමේ ක්‍රමවේදය**

අභියෝග්‍යතා පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**වෙනත් ප්‍රතිලාභ**

**ස්ථිර පදනම**
සේවක අර්ථ සාධක අරමුදල, සේවක භාරකාර අරමුදල, පාරිතෝෂික දීමනාව සඳහා හිමිකම, නොමිලේ ලබා දෙන සෞඛ්‍ය සහ ජීවිත රක්ෂණය, වාර්ෂික දිරි දීමනා, සේවකයින්ගේ දරුවන්ට ශිෂ්‍යත්ව, විශ්වවිද්‍යාලයීය රෝහලේ ප්‍රමුඛ ප්‍රතිකාර, සුබ සාධක ප්‍රවාහන සේවය සහ වෙනත් වරප්‍රසාද.

**කොන්ත්‍රාත් පදනම**
සේවක අර්ථ සාධක අරමුදල, සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම, වාර්ෂික දිරි දීමනා, විශ්වවිද්‍යාලයීය රෝහලේ ප්‍රමුඛ ප්‍රතිකාර, සුබ සාධක ප්‍රවාහන සේවය.

**පොදු කොන්දේසි - සියළුම කාර්ය මණ්ඩලය සඳහා**

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරුවන් තෝරා ගැනීම, ඒ ඒ තනතුරෙහි / ශ්‍රේණියෙහි අනුමත ඇබෑර්තු ගණන සම්පූර්ණ වනතෙක් පමණක් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය විසින් සිදුකරනු ඇත.
3. අයදුම්කරුවන් විසින් වෙබ් අඩවියෙන් (www.kdu.ac.lk) භාගත කරගෙන තමා විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ සහතිකවල සහතික කළ ඡායා පිටපත් සහිතව **2022 ඔක්තෝබර් මස 25** වෙනි දිනට හෝ එදිනට පෙර ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන යන ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් එවීම හෝ ගෙනවිත් භාර දීම කළ යුතුය.
4. ලියුම් කවරයේ ඉහළ වම්පස කෙලවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.
5. අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා අයදුම්පත් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.
6. රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩල, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා උසස් අධ්‍යාපන ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානියා හරහා තම අයදුම්පත් යොමු කළ යුතුය.

7. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් (www.kdu.ac.lk) භාගත කරගත හැකි ආකෘතිය මගින් පමණක් අදාල තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට තරයේ දන්වා සිටිනු ලැබේ. ප්‍රමාදවී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමිත ආකෘතියට පරිබාහිරව එවනු ලබන අයදුම්පත් සහ ඉහත අංක 06 හි ලබාදී ඇති උපදෙස් අනුගමනය කර නොමැති අයදුම්පත්‍ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. තෝරාගන්නා ලද අපේක්ෂකයින්ට මෙම විශ්වවිද්‍යාලයේ ඕනෑම පරිශ්‍රයක සේවය කිරීමට හා රාජකාරී කිරීමට හැකියාව තිබිය යුතුය.

9. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් අභියෝග්‍යතා පරීක්ෂණය/ ප්‍රායෝගික පරීක්ෂණය සහ/ හෝ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ඇත.

10. අයදුම්කරුවන් තෝරාගැනීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටියට අනුකූලව සහ ප්‍රායෝගික/ යෝග්‍යතා පරීක්ෂණ සහ/ හෝ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල පදනම් කරගෙන සිදුකරනු ඇත.

11. අයදුම්කරුවන් අභියෝග්‍යතා පරීක්ෂණය/ ප්‍රායෝගික පරීක්ෂණය සහ/ හෝ සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට පෙර ඔවුන් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලයට ඇත.

12. ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ආසන්නතම වැටුප් චක්‍රලේඛය අනුව වැටුප් ගෙවනු ලබයි. වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද වෙනත් දීමනා ගෙවනු ලැබේ.

13. කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය සඳහා 2018.12.03 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපි අංක DMS/1823/Vol-III අනුව වැටුප් ගෙවනු ලබයි.

**<u>පොදු කොන්දේසි - පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා</u>**

1. සුදුසුකම් සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය සහ 2017.06.28 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 15/2017 සහ අදාළ සංශෝධන වෙත යොමු වන ලෙස අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.

**<u>පොදු කොන්දේසි - ලිපිකරු සහ සමාන්තර ශ්‍රේණි සඳහා</u>**

1. සුදුසුකම් සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය සහ 2018.07.16 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 06/2018 සහ අදාළ සංශෝධන වෙත යොමු වන ලෙස අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.

**වැඩි විස්තර සඳහා සම්බන්ධ වන්න:**
කෂ්මි සන්දනායක මෙය
නියෝජ්‍ය ලේඛකාධිකාරි (ආයතන)
T: +94 (0) 11 263 2028 (Ext: 377) | 0710219289
“Staff Recruitment- KDU" <staffrecruit@kdu.ac.lk>